ආයතනයේ නම - ජාතික විගණන කාර්යාලය

පාර්ලිමේන්තුවේ රජයේ ඖෂුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119 (4) යටතේ ගරු ආයතන භාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

நிறுவனத்தின் பெயர் - தேசிய கணக்காய்வு அலுவலகம்

பாராளுமன்றத்தின் அரசாங்க கணக்குகள் குழுவினால் சமர்ப்பிக்கப்பட்ட அறிக்கை தொடர்பில் நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் கௌரவ நிறுவனப் பொறுப்பு அமைச்சரின் அவதானிப்புகள் மற்றும் எடுக்கப்பட்ட நடவடிக்கைகளை பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்

Name of the Institute- National Audit Office

Submission of the observations of the Hon. Minister in charge of the institutions under Standing Order No.119(4) in relation to the reports tabled by the Committee on public Accounts of the Parliament and the action to be taken to the Parliament

ආකෘති අංක 01

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංකය - 492

ආයතනයේ නම - ජාතික විගණන කාර්යාලය

කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කිරීම සඳහා ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග / වර්තමාන තත්ත්වය
පළමු කොටස	
1. 2017.06.26 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 7 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ දී මිලදී ගන්නා ලද වත්කම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර නොතිබුණි.	අභ්‍යන්තර ක්‍රියාවලිය විධිමත් කර චක්‍රලේඛ විධිවිධානවලට අනුගතව වත්කම් මිලදී ගැනීම් හා අපහරණයන් සිදුකරන අවස්ථාවල ඒ පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීමට පියවර ගෙන ඇත.
2. සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර තිබුණි.	ජාතික විගණන කාර්යාලයට අයත් සියලුම සංචිත වාහනවල ආයතනයේ නාමය භාෂා තුනෙන්ම ඇතුළත් කරමින් රාජ්‍ය ලාංඡනය පින්තාරු කළ මුද්‍රිත ස්ටිකර අලවා ඇත.
දෙවන කොටස	
1 2018.01.24 දිනැති අංක 05/2018(1) දරන චක්‍රලේඛයෙන් සංශෝධිත 2008.02.06 දිනැති අංක 05/2008 දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛය ප්‍රකාරව පුරවැසි/ සේවා ලාභී ප්‍රඥප්තියක් නිසි පරිදි ක්‍රියාත්මක කර නොතිබුණි. ආයතනයේ පුරවැසි/ සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය කිරීමට හෝ ඇගයුමට භාජනය කිරීමට ක්‍රමවේදයක් සකස්කර නොතිබුණි.	විගණකාධිපතිවරයාගේ කාර්යභාරයේ සුවිශේෂී තත්ත්වය අනුව, ව්‍යවස්ථාපිත විධිවිධාන ප්‍රකාරව විගණිත ආයතන වෙත වාර්තා නිකුත් කිරීම හා පාර්ලිමේන්තුව වෙත වාර්තා කිරීම සිදු කරන අතර මහජනයා වෙත සෘජු සේවා සැපයීමක් සිදු නොකරයි. එමනිසා සේවා ලාභී ප්‍රඥප්තියක් ක්‍රියාත්මක කර නොතිබුණ අතර නිසිපරිදි කාලීනව විගණන වාර්තා විගණිත ආයතන වෙත හා පාර්ලිමේන්තුව වෙත වාර්තා කරන බව තහවුරු වන ආකාරයේ විධිමත් ක්‍රමවේදයක් සකසා පරිගණකගත දත්ත පද්ධතියක් මඟින් අධීක්ෂණය කිරීම සිදුකර ඇත.

2	සියලු නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.	මෙවන විට සියලුම නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර ඇති අතර නව දූෂණ විරෝධී පනත අනුව, විධිමත් පරිදි කටයුතු කිරීම සඳහා සියලුම අදාළ නිලධාරීන් දැනුවත් කර ඇත.

එල්.එස්.අයි. ජයරත්න

විගණකාධිපති

එල්.එස්.අයි. ජයරත්න
විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය
306/72, පොල්දූව පාර
බත්තරමුල්ල